www.wsws.org

**ලෝක සමාජවාදී වෙබ් අඩවිය**

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

***සසප/ලෝසවෙඅ ගිම්හාන පාසල 2005***

# දෙවන දේශනය: විසිවන සියවස අද්දර සංශෝධනවාදයට එරෙහි ව මාක්ස්වාදය

***තුන්වන කොටස***

**Lecture two: Marxism versus revisionism on the eve of the twentieth century Part 3**

**ඩේවිඩ් නෝත් විසිනි**

**2005 සැප්තැම්බර් 05**

*2005 අගෝස්තු මස 14 වැනිදා සිට 20 වැනි දා දක්වා මිචිගන්හි ඈන් ආර්බර්හි දී පැවැත්වුනු සමාජවාදී සමානතා පක්ෂයේ/ලෝසවෙඅ ගිම්හාන පාසැලෙහි දී ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කර්තෘ මන්ඩල සභාපති ඩේවිඩ් නෝත් විසින් පවත්වනු ලැබූ "විසිවන සියවස අද්දර සංශෝධනවාදයට එරෙහි ව මාක්ස්වාදය" යන දේශනයේ තුන්වන හා අවසාන කොටස යි මේ. මෙය පාසැලෙහි පැවැත්වුනු දෙවන දේශනය යි.*

## එඩුවාර්ඩ් බර්න්ස්ටයින්ගේ සංශෝධනවාදය

බර්න්ස්ටයින්ගේ සංශෝධනවාදය පලමුවෙන් ම මතු ව ආවේ කවදා ද? බොහෝ රෝග ලක්ෂන පැවතිනි. සත්තකින් ම සිය සමාජවාදී වෘත්තියෙහි මුල දී බර්න්ස්ටයින් විප්ලවවාදී මාක්ස්වාදය සුලුධනේශ්වර මානවවාදී වාගාලාප යොදා සැර බාල කිරීමේ නැඹුරුවක් ප්‍රකට කර තිබුනේ ය. 1870 ගනන්වල අග දී බර්න්ස්ටයින් තරුන සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ භාරකරුවකු හා ධනවතෙකු වූ, විශේෂයෙන් ම මධ්‍යම පන්තීන්ට ආචාර ධර්මානුකුල පදනමක් මත ආයාචනය කල ජනප්‍රිය, බහුපන්තික ව්‍යාපාරයක් වූවිට සමාජවාදයට වඩා හොඳ අනාගත අපේක්ෂා පවතිනු ඇතැයි විශ්වාස කල කාල් හොෂ්බර්ග් සමග පෙලගැසී ගත්තේ ය. බෙබෙල්ගේ සහ එංගල්ස්ගේ පීඩනය යටතේ බර්න්ස්ටයින් මේ ආස්ථානයෙන් පසු බැස්සේ යත එහෙත් දේශපාලනයේ බොහෝ විට සිදු වන පරිදි තාරුන්‍යයේ අත්වැරදි ලෙස පලමු ව ප්‍රකට වන දෑ දේශපාලන ප්‍රවනතාවක මුල් කාලීන ලක්ෂන බවට පරිවර්තනය වෙයි.

බර්න්ස්ටයින් පසුව එංගලන්තයට සංක්‍රමනය වී ප්‍රතිසංස්කරනවාදී ෆේබියන් ව්‍යාපාරයේ නියෝජිතයන් සමග අතිශය මිත්‍රශීලී සබඳතා වගා කරගත්තේ ය. විප්ලවවාදී චාටිස්ට්වාදය බිඳ වැටීමෙන් අනතුරු ව කම්කරු ප්‍රතිසංස්කරනවාදය වල් පැලැටි මෙන් පැතිර ගිය බ්‍රිතාන්‍යයේ දී ලද අත්දැකීම් බර්න්ස්ටයින් මත ප්‍රගාඪ කාවැදීමක් ඇති කලා වීමට බෙහෙවින් ඉඩ තිබේ. එහි ස්ථාවර මධ්‍යම පන්තිය ද ගැඹුරින් මුල් බැසගත් පාර්ලිමේන්තු ක්‍රමය ද සහිත සමෘද්ධිමත් බ්‍රිතාන්‍යය තුල ධනවාදය විප්ලවවාදී ව පෙරලා දැමීම සඳහා වූ අනාගතාපේක්ෂා බර්න්ස්ටයින්ට පෙනුනේ බෙහෙවින් දුරස්ථ ලෙසිනි.

1895 මුල දී, මාක්ස් විසින් 1850 දී රචිත *ප්‍රන්සයේ පන්ති අරගලය* යන කෘතියේ නව සංස්කරනයක් සඳහා තමන් ලියූ හැඳින්වීම, මාක්ස් නැමැති වයසට ගිය විප්ලවවාදියා සමාජවාදය කරා සාමකාමී මාවතක අනුගාමිකයකු වී ඇති බව ඇඟවෙන පරිදි බර්න්ස්ටයින් සහ කෞට්ස්කි විසින් සංස්කරනය කරනු ලැබ ඇති බව සෙයා ගත් කල එංගල්ස් බලවත් කනස්සල්ලට පත් විය. එංගල්ස්, සිය අභාවයට යන්තම් මාස හතරකට පෙරාතුව 1895 අප්‍රේල් 1 වැනි දා කෞට්ස්කි වෙත කෝපයෙන් මෙසේ ලිවී යඃ

" මා මොනවා වුවත් නෛතිකත්වයේ සාමකාමී පාක්ෂිකයෙකු හැටියට මවාපාන අයුරින් විකෘති කෙරුනු මගේ 'හැඳින්වීමේ' උද්ධෘතයක් *ෆෝවර්ට්ස්* පුවත්පතෙහි මගේ අනුදැන්මෙන් තොර ව මුද්‍රනය කර තිබෙනු දැක මම අද පුදුමයට පත් වුනෙමි. මේ අපකීර්තිමත් ධාරනාව මකා දමනු පිනිස එය සම්පූර්නයෙන් ම හැමැ 'සැඵ හි පල වනු දැකීමට මා කැමති හේතුව අන් සියල්ලට මත් වඩා එය යි. මේ පිලිබඳ ව මා සිතන්නේ කුමක් ද යන්න ගැන මා ලිබ්නෙක්ට්ට කිසිදු සැකයක් ඇති වීමට ඉඩ නොතබන අතර ඔහුට මගේ අදහස් විකෘත කිරීමේ අවස්ථාව ලබා දුන් හා මට ඒ ගැන වචනයකුදු නො කීමට තරම් වූ අයට ද ඔවුන් කවුරුන් ද යන්න නොතකා එය ම අදාල වෙයි"[1]

එංගල්ස්ගේ අභාවයෙන් වසරකට මඳක් පසු 1896 ඔක්තෝබරයේ දී බර්න්ස්ටයින් මාක්ස්වාදයේ විප්ලවවාදී වැඩපිලිවෙල විවෘත ව ප්‍රතික්ෂේප කිරීමේ

රුපික ආරම්භය සලකුනු කල ලිපියක් " සමාජවාදයේ ගැටලු" යන මැයින් සම්පාදනය කලේ ය. ඔහුගේ ලිපිය, යුරෝපය තුල සමාජවාදී ව්‍යාපාරයේ ශීඝ්‍ර වර්ධනය හා වැඩෙන්නා වූ බලපෑම සනිටුහන් කරමින් ආරම්භ විය. සමාජවාදීන් විසින් පෙරට දමනු ලැබූ ඉල්ලීම් කෙරෙහි අවධානය යොමු කිරීමට ධනේශ්වර පක්ෂවලට පවා සිදු විනි. මේ සාර්ථකත්වයන් සමාජවාදය සම්පූර්න ජයග්‍රහනය එළිපත්තේ සිටින බවක් අදහස් නොකල නමුදු සමාජවාදී ව්‍යාපාරය පවත්නා යථාර්ථය කෙරෙහි උසුලන බොහෝ සෙයින් නිෂේධනාත්මක ආකල්පය අත්හැර දැමීම අවශ්‍ය කර ඇතැයි බර්න්ස්ටයින් තර්ක කලේ ය. ඒ වෙනුවට සමාජවාදීන්ට "ප්‍රතිසංස්කරනය සඳහා ධනාත්මක ඇඟවුම් ද සහිත ව පෙරට ඒමට"[2] සිදු ව තිබේ.

මී ලග දශක දෙක තුල දී බර්න්ස්ටයින්, *සමාජවාදයේ පූර්වකොන්දේසි* කෘතිය ප්‍රකාශයට පත් වීමෙන් කුලු ගැන්වෙන සාම්ප්‍රදායික මාක්ස්වාදය පිලිබඳ සිය විචාරය විස්තාරනය කිරීමට නියමිත විය. මේ ලේඛන පැහැදිලි කලේ බර්න්ස්ටයින් එකග වූ එක ද අංශයක් වත් මාක්ස්වාදයෙහි නැති බව යි. හේගල්ට එහි ඇති දාර්ශනික නයගැතිභාවය සහ එය අපෝහක විධික්‍රමය වැලඳගැනීම ඔහු ප්‍රතික්ෂේප කලේ ය. ධනවාදයේ සැබෑ වර්ධනය විසින් මාක්ස්ගේ ආර්ථික විශ්ලේෂනය නිෂ්ප්‍රභ කරනු ලැබ ඇතැයි බර්න්ස්ටයින් තර්ක කලේ ය. විශේෂ වසයෙන්, තමන් "සමාජවාදී ව්‍යසනජ්වරය" (සෝෂලිස්ට් කැටස්ට්‍රොෆයිටිස්) ලෙස හැඳින්වූ ධනවාදය අභ්‍යන්තර පරස්පර විරෝධයන්ගේ ප්‍රතිඵලයක් වසයෙන් අත්‍යන්ත අර්බුදයක් කරා ගමන් ගන්නේ ය යන විශ්වාසය බර්න්ස්ටයින් පිලිකෙව් කලේ ය. කලින් කල හටගන්නා අර්බුදවල සම්භාවිතාව පිලිගන්නා අතර ම - නය භාවිතය වැනි - එවැනි අර්බුදයක් දින නියමයක් නොමැති ව කල් දමා ගත හැකි හෝ වඩා සතුටුදායක තත්වයකට පත් කරගත හැකි "හැඩ ගැස්වීමේ මාර්ග" ධනවාදය වර්ධනය කරගෙන ඇති බවත් තවදුරටත් වර්ධනය කරනු ඇති බවත් බර්න්ස්ටයින් අවධාරනය කර සිටියේ ය.

කිසිදු ලෙසකින් සමාජවාදයේ අනාගතය, ධනවාදී පද්ධතියේ මුඛ්‍ය අර්බුදයක නොවැලැක්විය හැකි බව සමග සම්බන්ධ නොකල යුතු ය යි බර්න්ස්ටයින් අවධාරනය කලේ ය. 1898 සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ස්ටුට්ගාඩ් සම්මේලනයට බර්න්ස්ටයින් ලියූ පරිදි:

"අප ධනේශ්වර සමාජයේ අත්‍යාසන්න කඩාවැටීමක එළිපත්තේ සිටිතියි ද සමාජ ප්‍රජාතන්ත්‍රවාදය සිය *උපායන් එවැනි පැමිනෙන්නා වූ මහා ව්‍යසනයක අනාගතාපේක්ෂා විසින් නිර්නය කරනු ලැබීමට* හෝ *ඒ මත රඳා පැවතීමට* ඉඩ දිය යුතු ය යි ද පැවසෙන අදහසට මම විරුද්ධ ව ඇත්තෙමි. මම මේ අදහසෙහි සියලු ආකාරවලින් ම රැඳී සිටිමි."[3]

මෙය කේන්ද්‍රීය තර්කයක් විය: අත්‍යවශ්‍ය ප්‍රශ්නය වූයේ "ව්‍යසනයන්" හටගන්නා නිශ්චිත හා විචිත්‍රාකාර රූපාකාරය පෙරදැකීම පිලිබඳ කාරනයක් නො වේ. සියලු කාල හා කොන්දේසිවලට වලංගු වන පෙරදැකීමක් කල නොහැකි ය. ඒ වෙනුවට තීරනාත්මක ප්‍රශ්නය වූයේ සමාජවාදයේ වර්ධනයත් ධනේශ්වර පද්ධතියේ පවත්නා අභ්‍යන්තර පරස්පර විරෝධතාවනුත් අතර කිසිදු වෛෂයික හා අවශ්‍ය සම්බන්ධයක් පවත්නේ ද නැද්ද යන්න යි. එවැනි සම්බන්ධයක් නොපවතී නම් එවිට ඓතිහාසික *අවශ්‍යතාවක්* වසයෙන් සමාජවාදය ගැන කතා කිරීම කල නොහැකි වෙයි.

මේ අවශ්‍යතාව නොමැති තත්වයක් තුල සමාජවාදය සඳහා සහේතුකත්වය සම්පාදනය කලේ කුමක් ද? බර්න්ස්ටයින්ට නම් සමාජවාදය සාධාරනීකරනය කල හැකි හා කල යුතු වූයේ සදාචාරාත්මක හා මානවවාදී පදනමක් මත ය, එනම් පහත දැක්වෙන නීරෝධාඥාව අනතර්ගත කරගන්නා කාන්ට්ගේ නිරුපාධික විධානය දේශපාලනය පිලිබඳ ක්ෂේත්‍රය තුල යෙදවීම යි: " ඔබ මෙන්ම අන් සියලු දෙනා තුලත් සිටින්නා වූ මිනිසා, සෑම කල්හි ම හුදෙක් මාර්ගයක් වසයෙන් නො ව නිෂ්ඨාවක් වසයෙන් සැලකීමට ක්‍රියා කරන්න"

සමාජවාදය සඳහා ආචාරධාර්මික පදනමක් ස්ථාපිත කිරීමට බර්න්ස්ටයින් දැරූ ප්‍රයත්න අලුත් දෙයක් නො වී ය. සත්තකින් ම කාන්ට්ගේ නිරුපාධික විධිය තර්කානුකූල ව සමාජවාදය කරා ගමන් කරතියි විශ්වාස කල වැදගත් නව කාන්ටියානු ශාස්ත්‍රඥයින් කන්ඩායමක් 1890 ගනන්වල සිටියෝ ය. ප්‍රමුඛ නව-කාන්ටියානු දාර්ශනික මොරිස් කොහෙන් වැනි ඇතැමෙක්, කාන්ට්, ඔහුගේ ආචාර විද්‍යාවේ පදනම මත "ජර්මානු සමාජවාදයේ සැබෑ සහ තථ්‍ය සමාරම්භකයා" වසයෙන් සැලකිය යුතු ය යි තර්ක කලෝ ය.[4]

මෙය සාවද්‍ය ද ලාමක ද විය. සදාචාර කාර්යය තුල නිරුපාධික විධානය අත්පත් කර ගන්නේ පොදුවේ සාමාන්‍ය පුද්ගලයකුගේ දෛනික ක්‍රියාකාරිත්වය තුල ව්‍යවහාරික බුද්ධිය අත්පත් කරගන්නා ස්ථානය ම ය. ව්‍යවහාරික බුද්ධිය යෙදවීම සෑම ආකාරයක ම බරපතල නොවන තත්වයන්හි දී සෑහීමකට පත් විය හැකි ප්‍රතිඵල ජනනය කරන්නේ යම් සේ ද පරම විධානය ද සීමා සහිත සමාජීය රාමුවක් තුල පිලිගත හැකි හැසිරීමක් උදෙසා මාර්ගෝපදේශයක් හැටියට සේවය කරනු ඇත. සම්පූර්නයෙන් ම පෞද්ගලික සම්බන්ධතාවන් පැවැත්වීමේ දී සිය සහෝදර මනුෂ්‍යයා මාර්ගයක් හැටියට නො ව නිෂ්ඨාවක් හැටියට සැලකීම අතිශයින් අගය කල යුතු වනු ඇත. එහෙත් දේශපාලන ජීවිතය තුල දී මේ විධානයට මොන ම අන්දමින් හෝ දැඩි ව එල්බ ගැනීම ඉහලින් ම ප්‍රශ්නකාරී වෙයි.

පන්තිවලට බෙදී ගිය සමාජයක් තුල මේ ආඥප්තිය විශ්වව්‍යාපී අන්දමින් යෙදීම කිසිදු බැරෑරුම් දේශපාලන අරුතකින් කල නොහැක්කක් ම වන්නේ ය. කාර්මික

ධනවාදය ජර්මනිය තුල පුලුල් ව වර්ධනය වන්නට බොහෝ පෙර ජීවත් වූ කාන්ට් හට සිය කේන්ද්‍රීය ආචාර විද්‍යාත්මක ප්‍රතිගෘහිතය ධනවාදී සමාජයක නිෂ්පාදන සම්බන්ධතාවන් සමග වෛෂයික ව සමහන් කරනු බැරි බව අවබෝධ කරගත නොහැකි විය. ධනපතියාට වැටුප් කම්කරුවා යනු අතිරික්ත වටිනාකම හා ලාභය නිෂ්පාදනය කරන්නා වූ මාර්ගය හැර අන් කුමක් ද?

බර්න්ස්ටයින්ට ප්‍රසිද්ධියේ අභියෝග කිරීමට සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය තුල මුලින් ම වූයේ විශාල පසුබට වීමකි. මුලින් ම බර්න්ස්ටයින්ගේ සංශෝධනයන්ට එරෙහි ව විවෘත හා අවසානය දක්වා වූ සටනක් කැඳවුම් කලෝ නම්, පලමු ව පාවුස් ද අනතුරු ව ප්ලෙකානොව් ද වසයෙන් රුසියානු මාක්ස්වාදීහු ය. ප්ලෙකානොව් දේශපාලන විවාදයේ දී සිය සුප්‍රකට "සිරකරුවන් නොගන්නා" ප්‍රවේශය අනුගමනය කරමින් බර්න්ස්ටයින්ගේ දාර්ශනික සංකල්පනයන්ගේ බංකොලොත්කම අනාවරනය කල ප්‍රහාරාත්මක ලිපි මාලාවක් ලිවී ය. මේ රචනා අපෝහක විධික්‍රමය හා මාක්ස්වාදයේ න්‍යායික පදනම් පිලිබඳ උසස් ම විවරන අතරට අයත් වෙයි. 27 හැවිරිදි රෝසා ලක්සම්බර්ග් විසින් සම්පාදිත ප්‍රතිසංස්කරනය ද විප්ලවය ද කෘතිය වඩා හොඳින් ප්‍රකට ය. එහි පලමු පරිච්ඡේදයෙහි මාක්ස්වාදයට එරෙහි බර්න්ස්ටයින්ගේ ප්‍රහාරය මගින් ඉදිරිපත් කෙරුනු මූලික කාරනය ඇය සංක්ෂිප්ත ව ගොනු කලා යඃ

"එනයින් සංශෝධනවාදී න්‍යාය තමන්ව උභතෝකෝටිකයක් තුල පිහිටුවා ගනියි. සමාජවාදී පරිවර්තනය වනාහි, එක්කෝ මේ දක්වා පිලිගැනුනු පරිදි ධනවාදයේ අභ්‍යන්තර පරස්පර විරෝධයන්ගේ ප්‍රතිඵලය යි. තව ද නොවැලැක්විය හැකි ලෙස ම කිසියම් ස්ථානයක දී එහි කඩා වැටීම ජනනය කරන පරස්පර විරෝධයන් ධනවාදයේ වර්ධනය සමග ම වැඩෙයි. (එහි දී 'හැඩගැස්වීමේ මාර්ග' ප්‍රතිඵල රහිත වන අතර කඩා වැටීමේ න්‍යාය නිවැරදි වෙයි.) එසේ නැත හොත් 'හැඩගැස්වීමේ මාර්ග' සත්තකින් ම ධනේශ්වර පද්ධතියේ කඩා වැටීම නවතන අතර එනයින් තමන්ගේ ම පරස්පර විරෝධතා යටපත් කරගනිමින් තමන් පවත්වාගැනීමට ධනවාදයට ඉඩ ලැබෙයි. එහි දී සමාජවාදය ඓතිහාසික අවශ්‍යතාවක් වීම නවතී. එවිට එය ඔබට කැමති ඕනෑ ම දෙයක් බවට පත් වන මුත් තවදුරටත් සමාජයේ ද්‍රව්‍යමය සංවර්ධනයේ ඵලය නම් නො වේ.

"මේ උභතෝකෝටිකය තවත් එකකට මග පාදයි. එක්කෝ ධනේශ්වර සංවර්ධනය පිලිබඳ සිය ආස්ථානයේ දී සංශෝධනවාදය නිවැරදි ය, එහෙයින් සමාජයේ සමාජවාදී පරිවර්තනය වනාහි මනෝරාජ්‍යයක් පමනි. නැති නම් නම් සමාජවාදය මනෝරාජ්‍යයක් නොවන අතර 'හැඩගැස්වීමේ මාර්ග' පිලිබඳ න්‍යාය වැරදි ය. ප්‍රශ්නය සැකෙවින් එසේ ය."[5]

සමාජවාදයේ පූර්වකොන්දේසි කියවද්දී දහනව වන සියවස අවසානයේ ධනවාදයේ මතුපිටට යටතින් වූ තර්ජනාත්මක ගර්ජනයන් ගැන බර්න්ස්ටයින් සපුරා ම නොදැනුවත් ව සිටින්නාවූ තරම දැකීමෙන් කෙනෙකු විස්මයට පත් වීම වැලැක්විය නොහැකි ය. ආර්ථික සංවර්ධනයේ දර්ශක, මහජනතාවගේ ජීවන කොන්දේසි නංවාලමින් අසීමිතාකාරයෙන් ඉහලට ගමන් කරනු ඇතැයි ඔහු ඉමහත් සංතෘප්තියකින් යුක්ත ව උපකල්පනය කලේ ය. දැවැන්ත අර්බුදයක් පිලිබඳ අදහස බර්න්ස්ටයින්ට පෙනුනේ අමු පිස්සුවක් ලෙසිනි. යටත් විජිතවාදය හා මිලිටරිවාදය පිලිබඳ නව ප්‍රපංචය - එලඹෙන ව්‍යසනය අත් කර ගැනීමට ඉඩ ඇති රූපාකාරයන්ගෙන් එකක් වූ - දැවැන්ත ව සන්නද්ධ වූ ධනේශ්වර රාජ්‍ය අතර යුද්ධයකට ගමන් කරනු ඇත යන අනතුරු ඇඟවීම පවා බර්න්ස්ටයින් විසින් බැහැර කෙරුනේ හීතිකා-පැතිරවීමක් වසයෙනි. "ව්‍යසනාවකට, ගිනි අවි භාවිතයෙන් නො ව වෙනත් මාර්ගවලින් දේශපාලන වෙනස්කම් විසඳාගැනීමට අපි වැඩි වැඩියෙන් පුරුදු වෙමින් සිටින්නෙමු යි" බර්න්ස්ටයින් ආත්ම තෘප්තියෙන් යුක්ත ව සඳහන් කලේ ය."[6] විසිවන සියවස අද්දර යි මේ!

ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ නායකයින්ගේ පසුබට වීම තිබිය දීත් බර්න්ස්ටයින්ගේ දෘෂ්ටීන්ට එරෙහි විවෘත අරගලයක් වලක්වාලිය හැකි වූයේ නැත. හැකි තරම් දුරට සිය පෑන එසවීම කල් දමූ නමුදු - ජර්මානු හා යුරෝපීය සමාජවාදී ව්‍යාපාරයේ සකල න්‍යායික කාරනා පිලිබඳ පරම විනිසුරු වූ - කෞට්ස්කි අන්තිමේ දී බර්න්ස්ටයින්ට එරෙහි ලැයිස්තුවට එක් වී සන්සුන් අන්දමින් ඔහුගේ මූලික තර්ක ප්‍රතික්ෂේප කලේ ය. 1898 පක්ෂ සම්මේලනයේ දීත් ඉන් පසු වසරවල සම්මේලනවලදීත් බර්න්ස්ටයින්ගේ මිථ්‍යාග්‍රහයන් නිල වසයෙන් හෙලා දකින ලදි. න්‍යායික තලයක දී මාක්ස්වාදය ආධිපත්‍යය පවත්වා ගත්තේ ය. එහෙත් වෙනත් තලයක, එනම් පක්ෂ භාවිතය හා සංවිධානය තුල න්‍යායික සංශෝධනවාදයට එරෙහි අරගලය මොන යම් ම හෝ බලපෑමක් සිදු කලේ නැත.

බර්න්ස්ටයින් නෙරපා හරින මෙන් ප්ලෙකානොව් එස්.පී.ඩී. යෙන් ඉල්ලා සිටිය විට යෝජනාව පක්ෂ නායකත්වය විසින් නිරවශේෂයෙන් ප්‍රතික්ෂේප කරනු ලැබිනි. සංශෝධනවාදී න්‍යාය සහ එස්.පී.ඩී.යේ භාවිතය හා සංවිධානය අතර පැවැති අතිශයින් සැබෑ සම්බන්ධතාව ගවේෂනය කොට අනාවරනය කිරීම සඳහා කිසිදු බලවත් අභිලාෂයක් පක්ෂ නායකයින් අතර පැවතියේ නැත. එසේ කිරීමක් නොවැලැක්විය හැකි ලෙස ම එස්.පී.ඩී.යත් අඩු ගනනේ නාමික ව පක්ෂයේ පාලනය යටතේ පැවති වෘත්තීය සමිතිත් අතර වූ සම්බන්ධතාව ප්‍රශ්නයට භාජනය කරන්නට ඉඩ තිබිනි.

එස්.පී.ඩී. නායකයින්, විශේෂයෙන් වෘත්තීය සංගම්වල දෛනික භාවිතාව සමග බැඳී තිබූ

අවස්ථාවාදයේ ප්‍රායෝගික රූපාකාරයන්ට එරෙහි විවෘත අරගලයක් රුචි නොකලේ මන්ද යන්නට හේතු ගනනාවක් විය. එවැනි අරගලයක් පක්ෂය භේද කරතියි ද, කම්කරු පන්තික කොටස් අතර බිඳීමක් ඇති කරතියි ද, දශක ගනනාවක සංවිධානාත්මක වර්ධනය අනතුරේ හෙලතියි ද, එස්.පී.ඩී.යට එරෙහි රාජ්‍ය මර්දනයට පහසුකම් සපයතියි ද ඔවුහු බියපත් වූහ. මේවා බැරෑරුම් සලකා බැලීම් විය. එසේ වුව ද එස්.පී.ඩී.ය දේශපාලන අවස්ථාවාදයට එරෙහි අරගලය මගහැරීමේ ප්‍රතිඵල ප්‍රගාඪ ද ඛේදජනක ද වූයේ ය.

එමතු ද නොව සංශෝධනවාදය සරල ව ජර්මානු ප්‍රශ්නයක් වූයේ නැත. දෙවන ජාත්‍යන්තරය පුරා ම විවිධ රූපාකාරයන්ගෙන් එය ප්‍රකාශයට පත් විය. 1899 දී වානිජ ඇමැතිවරයා ලෙස සිය කැබිනට් මන්ඩලයට එක් වන මෙන් ප්‍රන්ස ජනාධිපති වෝල්ඩෙක් රූසෝ කල ආරාධනය සිය නායකයින්ගෙන් කෙනෙකු වූ අලෙක්සාන්දර් මිලෙරොං පිලිගත් කල්හි ප්‍රන්ස සමාජවාදී පක්ෂය හෙල්ලුම් කැවේ ය. මේ සිදුවීම, බර්න්ස්ටයින්වාදයේ තර්කනය පන්ති සහයෝගීතාවට, ධනේශ්වරයට දේශපාලනික ව යටත් වීමට සහ එහි රාජ්‍යය ආරක්ෂා කිරීමට මග පාදන බව මොනවට පැහැදිලි කලේ ය.

ප්‍රතිසංස්කරනවාදයට එරෙහි අරගලය ක්‍රමානුකූල ව වර්ධනය කොට එහි වඩාත් දුරදිග යන දේශපාලන ගම්‍යයන් දක්වා ක්‍රියාවෙහි යොදවනු ලැබුවේ දෙවැනි ජාත්‍යන්තරයේ එක් අංශයක්, එනම් රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය පමනි.

**සමාප්තයි.**

## සටහන්

7. *Collected Works*, Volume 50 (එකතු කල කෘති, 50 වන වෙලුම), නිව් යෝර්ක්: ඉන්ටර්නැෂනල් පබ්ලිෂර්ස්, 2004, 86 පි.

8. *Marxism and Social Democracy: The Revisionist Debate 1896-1898* (මාක්ස්වාදය සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදය: සංශෝධනවාදී විවාදය 1896-1898), සංස්කරනය එච්. ට්‍යුඩර් සහ ජේ.එම්. ට්‍යුඩර් විසිනි. කේම්බ්‍රිජ් යුනිවර්සිටි ප්‍රෙස්, 1988, 74 පි.

9. එඩුවර්ඩ් බර්න්ස්ටයින්, *The Preconditions of Socialism* (සමාජවාදයේ පූර්ව-කොන්දේසි), කේම්බ්‍රිජ් යුනිවර්සිටි ප්‍රෙස්, 1993, 1. පි.

10. පීටර් ගේගේ *The Dilemma of Democratic Socialism* (ප්‍රජාතාන්ත්‍රික සමාජවාදයේ උභතෝකෝටිකය) නම් කෘතියේ උපුටා දක්වා ඇත. (නිව් යෝර්ක්: කොලියර්, 1970), 152 පි.

11. London: Bookmarks (ලන්ඩන්: බුක්මාර්ක්ස්), 1989, 29 පි.

12. *Preconditions* (පූර්ව-කොන්දේසි), 162 පි.

© www.wsws.org